**කන්දකැටිය ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 18 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 17 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 මැයි 05 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.246,017 ක් වුවත්, එය රු.429,235 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැති ශේෂය හා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.183,218 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) උසාවි දඩ ආදායම තුල ඇතුලත් පළාත් සභාව විසින් රඳවා ගනු ලබන පසුගිය වර්ෂයට අදාල රු.11,547 ක් හා සමාලෝචිත වර්ෂයට අදාල රු.36,393 ක් වූ පරිපාලන වියදම් උසාවි දඩ ආදායම ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.36,393 ක් වැඩියෙන්ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන්ගේ ශේෂය හා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.47,940 ක් බැගින් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2014 යටතේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 05 ක් සහ විශේෂ ග්‍රාමීය සංචාර කඩිනම් සංවර්ධන වැඩසටහන - 2014 යටතේ ක්‍රියාත්මක කළ කර්මාන්තයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.3,191,674 ක් වුවත් රු.3,246,377 ක් වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන සැලසීම නිසා වර්ෂයේ අතිරික්තය හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගේ වටිනාකම රු.54,703 බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) බදුල්ල මහියංගණ පාරේ 21 හන්දිය අසල ඉදිකිරීමට අපේක්ෂිතව පැවති නමුත් 2015 මාර්තු වන විටද ඉදිකිරීම් ආරම්භ කර නොතිබූ බස් නැවතුම්පොලෙහි ඇස්තමේන්තුගත වටිනාකම වන රු.177,604 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා වර්ෂයේ අතිරික්තය රු.177,604 ක් අඩුවෙන් හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන්ගේ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 13,987,490 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.13,927,855 ක් විය.

### 1.3.3 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත | 2008 වර්ෂයේ සිට සේවකයින්ගේ වැටුපෙන් අඩුකර ගන්නා ලද රු. 420,434 ක සේවක අර්ථ සාධක අරමුදල සඳහා වූ දායක මුදල් නියමිත පරිදි එම අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 චක්‍රලේඛය | සභාව සතු කන්දකැටිය හන්දියේ පිහිටි කඩ කාමර 05 ක සහ පොල භූමියේ පිහිටි කඩ කාමර 03 ක මාසික බදු කුලී වසර 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,103,181 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 888,941 ක් විය. ඒ අනුව රු.2,992,122 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

## 2.2 ආදායම් පරිපාලනය

2.2.1 වෙළඳ බලපත්‍ර ගාස්තු, ජල ගාස්තු හා කඩ කුලීවලට අදාලව 2014 ජනවාරි 01 දිනට පැවැති හිඟයෙන් අයකිරීමේ ප්‍රගතිය සියයට 10 ට වඩා අඩුවූ අතර වර්ෂයේ බිල්කළ කඩ කුලී ආදායමින් අයකිරීමේ ප්‍රගතිය සියයට 13 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---:|
| උසාවි දඩ | 1,598,017 |
| මුද්දර ගාස්තු | 843,205 |
| | 2,441,222 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

1971 අංක 08 දරන පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල වෙත අවස්ථා තුනකදී රු.33,184 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි.

3.2 **නිෂ්කාර්ය වත්කම්**

-------------------

(අ) UPGY - 0873 දරන අත්ට්‍රැක්ටරය භාවිතයට නොගෙන සහා භූමියේ නිශ්කාර්යව රඳවා ඇති අතර, ට්‍රේලරය දිරාපත් වෙමින් පැවතුනි.

(ආ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් 2007 වර්ෂයේ දී සභාවට ලබාදී තිබූ විදුලි ජනක යන්ත්‍රය 2011 වර්ෂය අවසානයේ සිට ක්‍රියා විරහිතව පවතින අතර, එය අලුත්වැඩියා කොට ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර සභා භූමියේ නිෂ්කාර්යව රඳවා තිබුණි.

3.3 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභාව විසින් සණ අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදු නොකරන අතර එක්රැස් කරනු ලබන කසල මහවැලි අධිකාරියට අයත් රජ මාවතේ බුද්ධංකෝට්ටේ පිහිටි ඉඩමකට අක්‍රමවත්ව බැහැර කරමින් පැවතුනි.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ගබඩා පාලනය